www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපදය ඇෆ්ඝනිස්ථානය තුල ෆලූජා මාදිලියේ සංහාරයක් සූදානම් කරයි.

**US prepares Fallujah-style offensive in Afghanistan**

**ටොම් එලී විසිනි.**

**2009 දෙසැම්බර් 5**

කැරලි කරුවන්ගේ පාලනය යටතේ තිබෙන දකුනු ඇෆ්ඝනිස්තානයේ ප්‍රදේශයකට 1000 ක පමන භට කන්ඩායමක් පසුගිය සිකුරාදා ප්‍රහාරයක් එල්ල කල අතර එය, යුද්ධය සඳහා තවත් සොල්දාදුවන් 30,000 ක් යවන බවට ඔබාමා නිවේදනය කිරීමෙන් පසුව එක්සත් ජනපදය ප්‍රමුඛ වාඩිලාගත් හමුදා විසින් එල්ල කරනු ලැබූ පලමු දැවැන්ත ප්‍රහාරයයි.

හෙල්මන්ඩ් ප්‍රදේශයෙහි තලේබාන් ප්‍රතිරෝධයේ මධ්‍යස්ථානයක් බව එක්සත් ජනපද මිලිටරිය විසින් ප්‍රකාශකරන, විශාල සහ වඩා ජනාකීර්න නගරයක් වන මර්ජා නගරයට එල්ල කරනු ලබන ප්‍රහාරයක පෙර සූදානමක් ලෙස මෙම ප්‍රහාරය එල්ල කරන ලදී. නව් සැඩ් මෙහෙයුමේ අනදෙන නිලධාරී බ්‍රිගේඩියර් ජෙනරල් ලැරී නිකොල්සන් ප්‍රකාශකලේ මර්ජා නගරයට එල්ල කිරීමට නියමිත ප්‍රහාරය, 2004 දී දහස් ගනනින් සිවිල් වැසියන්ට මරු කැඳවූ ඉරාකයේ ෆලූජා නගරයට ගෙන ආ විනාශකාරී ප්‍රහාරයට සමාන වනු ඇති බවයි. එවන් ප්‍රහාරයක් කෙදිනක සිදුවනු ඇත්දැයි පැහැදිලි නැත.

සිකුරාදා උදෑසන සොල්දාදුවන් සිය ගනනක් උතුරේ සිට හෙල්මන්ඩ් පලාතේ නව් සැඩ් මිටියාවතට ගුවනින් ප්‍රවාහනය කල අතර දෙවන බලඇනි දකුනේ සිට පා ගමනින් පැමිනියේ "කෝබ්‍රාස් ඇන්ගර්" (නයි වෛරය) යනුවෙන් නම් ලද මෙහෙයුමටය. බ්‍රිතාන්‍ය භට කන්ඩායම් නැගෙනහිරින් උපකාරක ප්‍රහාරයක් දියත් කලහ. හෙලිකොප්ටර් සහ එම්වී-22 ඔස්ප්‍රේ ගුවන් යානා යොදාගනිමින් සිදුකල මෙම මෙහෙයුමට ඇෆ්ඝනිස්ථාන සෙබලුන් 150 ක් පමන සම්බන්ධ වූ බවට වාර්තාවේ.

ඒ.බී.සී.ප්‍රවෘත්ති වාර්තා මගින්, ඇමරිකානු හමුදා දැඩි කාලතුවක්කු ප්‍රහාර මගින් හිතුමතේ ගොඩනැගිලි බිමට සමතලා කරන අයුරු පෙන්වන ලදී. පලාතේ ඇමරිකානු හිතවාදී ආන්ඩුකාර ඩාවුඩ් අහමදි මෙහෙයුමේ ප්‍රතිපලයක් ලෙස මේ දක්වා තලිබාන් සටන්කාමීන් හතර දෙනෙකුගේ මලසිරුරු සොයාගෙන ඇතිබව සිකුරාදා ප්‍රකාශකලේය. ( පෙන්ටගන් සහ කාබුල් ආන්ඩු ද ඒ අයුරින්ම එක්සත් ජනපද මිලිටරි මෙහෙයුමෙන් මියගිය සියලු දෙනා තලිබානුවන් ලෙස විස්තර කරන ලදී.) නේටෝ සංවිධානය හමුදා සෙබලුන් මියගිය බවට වාර්තා පලකලේ නැත.

සොල්දාදුවන් 30,000ක් ඇෆ්ඝනිස්තානයට යවන බවට ඔබාමා - ඔවුන්ගෙන් බහුතරයක් රටේ දකුනු ප්‍රදේශයට යවනු ඇත - නිවේදනයකොට ගතවී ඇත්තේ දින තුනක් පමනි. හෙල්මන්ඩ් වලට එල්ල කල ප්‍රහාරය ඉදිරි වසරවල දී ඇෆ්ඝනිස්තානය තුල සිදුවන මෙහෙයුම් පිලිබඳ පූර්වාදර්ශයකි. නයි වෛරය මෙහෙයුමෙන් පෙන්වා ඇත්තේ ඇෆ්ඝන් ජනතාව ත්‍රස්ත කරවීමට සහ බියවැද්දවීමට විනාශකාරී ප්‍රචන්ඩත්වය යොදාගැනීම මගින් සංලක්ෂිත වී ඇති ඔබාමාගේ යුද උපාය මාර්ගයයි.

"මෙය, උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීමේදී තලිබාන්වරුන්ට බලාපොරොත්තු විය හැක්කේ කුමක්ද යන්න ගැන නිකුත් කරනු ලැබූ සංඥාවක් බවට කිසි ප්‍රශ්නයක් නැතැයි" ඇෆ්ඝනිස්තානයේ *අල්-ජසීරා* වාර්තාකරු ස්ටීවන් කැඹ් ප්‍රකාශකලේය.

හමුදා ප්‍රකාශකයින් පවසන පරිදි මෙහෙයුමේ කෙටි කාලීන උපාය වනුයේ, තලේබාන් "ආරක්ෂක ස්ථාන" විනාශ කිරීම, උතුරේ සිට දකුනටත් නැගෙනහිර සිට බටහිරටත් ඇති සැපයුම් මාර්ග කපා

දැමීම සහ නව් සෑඩ් ප්‍රදේශයෙන් "ප්‍රබල කැරලිකරුවන් 100 කට අධික පිරිසක්" මුළුමනින්ම ඉවත් කොට දැමීමයි.

නව් සෑඩ් වල කැරලිකරුවන් සංඛ්‍යාව ප්‍රමානයෙන් කුඩා වුවද ගිම්හාන කාලය තුල "ඇමරිකානු නාවික ඉදිරි මෙහෙයුම් මධ්‍යස්ථානයට යාර කීපයක් උතුරින් ඔවුන්ගේ ස්ථාවර ඉදිරි පෙරමුනක් පවත්වාගෙන යන තරමටම ඔවුන් ශක්තිමත් තැනකට" පත්ව ඇති බව යයි ඇසෝසියේටඩ් පුවත් වාර්තා කරයි.

වසර ගනනාවක සිට ප්‍රදේශය තුල කඳවුරුලාගෙන සිටින බ්‍රිතාන්‍යයන්ට හෝ ඇමරිකානුවන්ට, නව් සෑඩ් අල්ලාගෙන සිටීමට හැකි වූයේ නැත. ඇසෝසියේටඩ් පුවත් සේවයට අනුව, "වරක් එහි කඳවුරු ලාගෙන සිටි බ්‍රිතාන්‍යයන් ඉන් ඉවත්වූයේ 'ඇපොකැලිප්ස් නව්' නම් 1979 වියට්නාම යුද චිත්‍රපටයේ නාමය යොදාගනිමින් එම නගරය 'ඇපොකැලිප්ස් නව්-සෑඩ්' යනුවෙන් නම් කරමිනි. බ්‍රිතාන්‍ය ආරක්ෂක පවුරේ යාර කීපය ඇතුලතින් කැරලිකරුවන් කඩා පැනීමත් සමග අවස්ථා කීපයක දී ම එය බෙහෙවින් අඩපන විය. 2008 දී මිටියාවතෙහි වැඩි කොටසක් නැවත ලබා ගැනීමට සටන් කල කැරලිකරුවන් ප්‍රදේශය යලි අත්කර ගත්හ."

2001 ඇමරිකානු ආක්‍රමනයට පෙර නව් සෑඩ් නගරයේ පදිංචිකරුවන් 30,000 ක් සිටි අතර එය, අබිං වෙලඳම සඳහා පොපි මල් වගා කිරීමේ මධ්‍යස්ථානයක්ව පැවතුනි. පුවත් සේවයට අනුව දැන් එය "සුන්බුන්වූ හා සහ බෙහෙවින්ම ජනශුන්‍ය නගරයකි."

නව් සෑඩ් ප්‍රදේශය අත්පත්කර ගැනීම, මේ ගිම්හානයේ සිය ගම්වලට එල්ල වූ නාවික ප්‍රහාරයන්ගෙන් බේරීමට පලා ආ බොහෝ ඇෆ්ඝනිස්තානුවන් සිටින ප්‍රදේශයේ විශාල නගරයක් වන මර්ජා නගරයට ප්‍රහාරයක් එල්ල කිරීම පිනිස වූ පෙර සූදානමකි. මෙය, බලයට පත්වීමෙන් පසුව ඔබාමා විසින් 21,000කට අධික සෙබලුන් ඇෆ්ගනිස්ථානයට යැවීමෙන් පසුව, හමුදා ප්‍රහාර උත්සන්න කිරීමේ තවත් ප්‍රයත්නයකි.

ජෙනරල් නිකොල්සන් ඇතුළු නාවික භට කන්ඩායම් "2004 නොවැම්බරයේ සිදුකල ඉරාකයේ ෆලූජා සංහාරයට සමාන අයුරින්, ඇෆ්ඝනිස්තාන ජාතික හමුදාව සමග එක්ව මර්ජා නගරයෙන් තලේබානුවන් මුලුමනින්ම අතුගා දැමීමේ එක් සැලසුමක් මෙය බවට කිසිදු සැකයක් නැත" යනුවෙන් *ලොස් ඇන්ජලීස් ටයිම්ස්* පුවත්පත වාර්තා කරයි.

මර්ජා යනු, සතුරන්ට කන්ඩායම් ගැසීමට ඉඩ සැලසෙන, හෙල්මන්ඩ් ප්‍රදේශයේ අවසාන සුරක්ෂිත ප්‍රදේශයයි," නිකොල්සන් *ලොස් ඇන්ජලීස් ටයිම්ස්* පුවත්පතට ප්‍රකාශ කලේය. "අපි හදන්නේ එය ඔවුන්ගෙන් නිදහස්කර ගැනීමටය." වෙනත් තැනක නිකොල්සන් මර්ජා හඳුන්වා තිබුනේ එම නගරය "හෙල්මන්ඩ් හි පිලිකාවක්" ලෙසය.

"මර්ජා, ෆලූජා වලට වඩා විශාල වන අතර එය භට කන්ඩායම් සහ රථවාහන එහා මෙහා ගමන් කිරීමේ දී දුෂ්කරතාවයන් ඇති විය හැකි වාරිමාර්ග පද්ධති වලින් බෙදී පවතී." එමෙන්ම නාවුක භටයින් විසින් ගෙයින් ගෙට කුරිරු ප්‍රහාරයක් ආරම්භ කලහොත් එය සිවිල් වැසියන්ගේ මරන ඉතා ඉහල ඉතා ඉහල මට්ටමක පවතින නගරයක් ලෙස මහත් ප්‍රසිද්ධියක් ලබනු ඇත." යනුවෙන් එම පුවත්පත වාර්තා කලේය.

එ.ජ. හමුදා ෆලූජා නගරයට පහර දී විනාශකරන විට නිකොල්සන් නාවික භටයින්ගේ ප්‍රාදේශීය අනදෙන නිලධාරියෙකුව සිටියේය. මේ කාලයේදී ඇඳුම් පසාකරගෙන ගොස් සම පිලිස්සී යන සුදු පොස්පරස් රසායනික අවි භාවිතය ඇතුලු, දැවැන්ත පරිමානයේ බෝම්බ හෙලීම් වලට දහස් ගනන් සිවිල් ජනයා ගොදුරු විය. ප්‍රහාරය මගින් නගරයේ යටිතල පදනම සියයට 70 කින් පමන විනාශයට පත් විය.

අද මර්ජා මෙන් එදා ෆලූජාව තෝරා ගනු ලැබුවේ එය ඉරාකයේ ඇමරිකානු ආක්‍රමනයට ප්‍රතිවිරෝධය පෑ ප්‍රධාන මධ්‍යස්ථානයක් වූ හෙයිනි. නගරයට එල්ල කල බිහිසුනු ප්‍රහාරය - මෙය නූතන ඉතිහාසයේ දැවැන්තම යුද අපරාධයයි - එහි පදිංචි ජනතාවට දුන් සාමූහික දඬුවමක් ලෙස මෙන්ම ඇමරිකානු අධිරාජ්‍යවාදයේ ආක්‍රමනයට විරෝධය දක්වන්නන්ට කුමක්වේද යන්න පිලිබඳව ඉරාකයේ ඉතිරි ප්‍රදේශවලටත් සත්‍ය වශයෙන්ම ලෝකයටත් දෙන පූර්න අනතුරු ඇඟවීමක් ලෙස සලකනු ලැබීය.

විවෘතව ම මර්ජා නගරයට එ.ජ. හමුදා විසින් ෆලූජා ආකාරයේ ප්‍රහාරයක් සූදානම් කිරීම අනතුරු ඇඟවීමක් ලෙස ගත යුතුය. ඉදිරි වසරවල දී ඔබාමා පරිපාලනයේ "ධාවනය" ඉරාකය තුල බුෂ් පරිපාලනය

සිදුකල විනාශය ඉක්මවා යන ලේ වැගිරීමක් සහ යුද අපරාධ බවට පත් වනු ඇත. ඇමරිකාවේ සහ වෙනත් නේටෝ රටවල කම්කරු පන්තිය ඔබාමාගේ සංහාරයට එරෙහිව සහ මැතිවරනයේදී ඔහුට උදව් කල දැන් ඔහුගේ පරිපාලනයේ යුද අපරාධ අභියස මුනිවත රකින "ඊනියා වම්මුන්ට" එරෙහිව පෙරට පැමිනිය යුතුය.

ඔබාමා මැතක දී පකිස්තානය තුල ප්‍රිඩේටර් ඩ්‍රෝන් නමැති නියමුවන් රහිත ගුවන්යානා භාවිතයෙන් එල්ල කෙරෙන ප්‍රහාර වැඩි කිරීමට මධ්‍යම රහස් තොරතුරු ඒජන්සියට (සී.අයි.ඒ.) අධිකාරය පවරා තිබෙන බව *නිව්යෝර්ක් ටයිම්ස්* පුවත්පත විනාශකාරී ඝාතනයන්ට අනුබල දක්වන අයුරින් මැතක දී ලිවීය. එම වර්ගයේ මිසයිල් ප්‍රහාර මගින් සියගනනක් - සී.අයි.ඒ. හි නිලනොවන සංඛ්‍යා මගින් අවම වශයෙන් 400ක් පමන - පසුගිය වසර දෙක තුල මරාදමනු ලැබීය. සැබෑ ප්‍රමානය ආසන්න වශයෙන් 1000 කට ආසන්න වේ.

ජාත්‍යන්තර නීතිය සහ පකිස්ථානයේ ස්වාධිපත්‍යය නරුම ලෙස උල්ලංඝනය කරමින්, තලේබාන් සහ අල් කයිඩා ආධාරකරුවන්ට එරෙහිව බව පවසමින් ඩ්‍රෝන්ස් මිසයිල ප්‍රහාර ක්‍රියාත්මක කරයි. ගුවන්යානා මෙහෙයවනුයේ, වර්ජීනියා ප්‍රාන්තයේ ලැන්ග්ලේහි පිහිටි සී.අයි.ඒ. මූලස්ථානයේදී වීඩියෝ ක්‍රීඩා යන්ත්‍ර මගින් වීඩියෝ ක්‍රීඩා සිදුකරන ආකාරයෙනි. එ.ජ. විසින් අඛන්ඩව සිදු කරන ප්‍රහාර වල වගකීම නිල වශයෙන් ප්‍රතික්ෂේප කරන අතර, මිය යන පුද්ගලයින් තලේබාන් හෝ අල්කයිඩාවරු යයි ප්‍රකාශ කරනු ලැබේ. එහෙත් එම ප්‍රකාශ කිසිදු සාක්ෂියක් මඟින් සනාථ කරනුයේ නැත.

වොෂින්ටනය ඩ්‍රෝන් මිසයිල ප්‍රහාර ප්‍රයෝජනයට ගැනීම සහ සිය මායිම් ප්‍රදේශවල සිටින ගෝත්‍රික ජනතාවන්ට එරෙහිව පූර්න යුද මෙහෙයුම් දියත් කිරීමට බලකිරීම මඟින් පකිස්තානය අස්ථාවර කොට ඇති අතර ත්‍රස්ත ප්‍රහාර මාලාවක් උසිගන්වා ඇත.

මෙහි අලුත්ම සිද්ධිය සඳුදා ඇති විය. ත්‍රස්තවාදීන් සතර දෙනෙකු ස්වයංක්‍රීය ගිනි අවි සහ අත් බෝම්බ භාවිතා කරමින් පකිස්තානයේ ඉහල පෙලේ ජෙනරල්වරුන් සිකුරාදා දේව මෙහෙය සඳහා භාවිතා කල මුස්ලිම් පල්ලියක් ඉලක්ක කරගත්හ. 36 දෙනෙකු මරා දැමූ ඔවුහු තමන්ම පුපුරවාගෙන දිවි නසාගත්හ. මිය ගිය අය අතර ජෙනරල්වරු දෙදෙනෙකු සහ වෙනත් හමුදා නිලධාරීන් කිහිප දෙනෙකු විය.

ප්‍රහාරයේ රුදුරු භාවයෙන් පකිස්තාන ආන්ඩුව සහ මිලිටරි තන්ත්‍රය විශ්මයට පත් විය. ඉස්ලාමාබාදයට අයත් විශාල ප්‍රදේශයක් වන සහ පකිස්තානු මිලිටරි මූලස්ථානය පවතින රාවල්පින්ඩි නගරයේ දැඩි ආරක්ෂිත කලාපයක මෙය සිදු වූ අතර එය මාස දෙකක් තුල රාවල්පින්ඩි නගරයට එල්ල වූ තුන්වන ප්‍රහාරයයි. ඔක්තෝබර් 10 වන දින තුවක්කු කරුවන් පිරිසක් යුද හමුදා මූලස්ථානයට පහර දුන්නේය. දිනයක් පුරා දිග් ගැස්සී ගිය ගැටුමේ ප්‍රතිපලය වූයේ කැරලිකරුවන් ද ඇතුලුව 23 දෙනෙකු ඝාතනය වීමයි.

ඔක්තෝබරයේ සිට පකිස්තානය තුල ත්‍රස්ත ප්‍රහාර නිසා 400 කට අධික ප්‍රමානයක් මියගොස් ඇත.

© www.wsws.org